

**ශු ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමන්ට ප්‍රාර්ථනාව**

ස්වාමිනි කරුණා කළ මැනව.

ක්‍රිස්තුනි කරුණා කළ මැනව.

ස්වාමිනි කරුණා කළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව.

ක්‍රිස්තුනි අපේ ප්‍රාර්ථනා ගිවිස වදාළ මැනව.

පරමණ්ඩල වල වැඩ හිඳින පිතාවන දෙවියනි,

**අපට දයා කළ මැනව.**

ලෝකය නිදහස් කළාවූ පුත්‍රවන දෙවියනි,

**අපට දයා කළ මැනව.**

ස්ප්‍රීතු සාන්තු වන දෙවියනි,

**අපට දයා කළ මැනව.**

සුපරිශුද්ධ ත්‍රිත්වය වූ ඒක දෙවියනි,

**අපට දයා කළ මැනව.**

ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ජේසු තුමන්ගේත්,මරියතුමියගේත්,ඥාති වරයාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

මෙලොව සිටියදීම ජේසුතුමන් හා මරියතුමිය දැකීමත් උන්වහන්සේ හා එක්ව විසීමටත් භාග්‍ය ලද්දාවූ, ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

අපෝස්තුලු වරයෙක් යන උසස් තත්වයට ඔසවනු ලැබීමේ භාග්‍ය ලද්දාවූ, ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ඔබගේ දිව්‍ය සමිඳානන් විසින් පා සෝදනු ලැබීමේ භාග්‍ය ලද්දාවූ, ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

අන්තිම භෝජන වැළඳීමේ භාග්‍ය ලැබූ, ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ඔබගේ සෙනෙහෙවන්ත සමිඳානන්ගේ මරණය දැකීමෙන් ශෝකයට පත්වූනාවූ, ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ක්‍රිස්තු ස්වාමිදරුවන්ගේ උත්ථානයත් මහිමෝත්තම අහස් නැගීමත් දර්ශනය කිරීමේ භාග්‍ය ලද්දාවූ, ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ශුද්ධාත්මයාණන් වැඩමකළ කල්හි ශුද්ධාත්ම වරප්‍රසාදයෙන් පූර්ණ වූනාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

පර්සියා දේශයෙහි සුවිශේෂ දේශනා කළාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

අනෙක් ජනයන් සත්‍ය විශ්වාසයට හරවා ගත්තාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් විශ්මය ජනක ප්‍රාතිහාර්යයන් සිදු කළාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

මිත්‍යාදෘෂ්ටික රාජෙකු හට ශරීර සුවය ලබාදී ඔහුට ආත්මික සුවයද අත්කර දුන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

යක්ෂයන් විමතියට පමුණුවා ඔවුන්ගේ පේන කාරයන් ගොලු බවට පත් කළාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

තමන්ගේ බලවත් සතුරු රජකු සමඟ විශිෂ්ට සාම ගිවිසුමකට එළඹීමට හැකි බව දුර්වල රාජ කුමාරයකුට දිව්‍යසින් ප්‍රකාශ කරන ලද්දාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

මනුෂ්‍යයන්ට අනතුරු පැමිණවීමේ බලය විෂඝෝර සර්පයන් කෙරෙන් ඉවත් කළාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

අභක්තිකයන්ගේ තර්ජන වලට බිය නොවී නිර්භයව ක්‍රිස්තුන් වහන්සේගේ ධර්මය දේශනා කළාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ඔබගේ දිව්‍ය සමිඳානන් වෙත දැක්වූ ප්‍රේමයෙන් මහිමවත් ලෙස ප්‍රාණ පරිත්‍යාගී බවට පැමිණියාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

සදහටම පවතිනු සඳහා ශුද්ධවූ විශ්වාසය රැකගනුවස් උද්යෝගිමත් වන ලෙස අපට අනුශාසනා කරන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

දෙවියන් වහන්සේට කවටබස් දොඩමින් උන්වහන්සේගේ තේජවන්භාවයට අපහාස කරන්නාවූ නවීන මනුෂ්‍යන්ගෙන් පරෙස්සම් වන ලෙෂ අපට අවවාද කරන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

කාමුක වුද අශුද්ධ වුද සියල්ලන්ට වෛර කිරීමට අපද පොළඹවන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

අන්තිම විනිශ්චය දවස සිහි කරවමින් පාපිෂ්ඨයන්ට තර්ජනය කරන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

දෙවියන් වහන්සේට නිරතුරු ප්‍රේම කරමින් සදාකාල ජීවනය ලබනු සඳහා ජේසු ක්‍රිස්තු ස්වාමිදරුවන්ගේ දයා කරුණාව බලාපොරොත්තු වීමට අපට අනුශාසනා කරන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

බලාපොරොත්තු විරහිත අවස්ථා වලදී අපට පිහිට වෙන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ඔබට යාච්ඤා කරන සියල්ලන්ට ආරක්ෂාව හා සහනය සලසා දෙන්නාවූ ශු.ජුඩ් තද්දේයුස් අපෝස්තුලු තුමෙනි,

**අප නිසා යාච්ඤා කළ මැනව.**

ලෝක පාපවල් හරින දේවාජබාලක වූ ජේසුනි,

**අපට ක්ෂමා කළ මැනව ස්වාමි.**

ලෝක පාපවල් හරින දේවාජබාලක වූ ජේසුනි,

**අපේ ප්‍රාර්ථනා අසා වදාළ මැනව ස්වාමි.**

ලෝක පාපවල් හරින දේවාජබාලක වූ ජේසුනි,

**අපට දයා කළ මැනව ස්වාමි.**

ප : ක්‍රිස්තු තුමන්ගේ වාක්දාත වලට අප හේතුවන්ත වන ලෙස,

උ : ශු ජුඩ් තද්දේවුස් අපෝස්තුලු තුමෙනි,අප නිසා යාච්ඤා කළ මැනව.

ඔබගේ සහය ඉල්ලන සියල්ලන් උදෙසාත් යාච්ඤා කළ මැනව.



**යාච්ඤා කරම්හ.**

ඉතා වනචාරි වුද,ඈත රටවල වාසය කළාවුද ජනයන් අතර විශ්වාසය පතුරුවා දේව වචනයේ බලයෙන් අනෙක ජාති ගෝත්‍රයන් ජේසු ක්‍රිස්තු තුමන්ගේ වසඟයට පැමිණෙව්වාවු ශු.ජුඩ් තද්දේවුස් අපෝස්තුලුතුමෙනි,ජේසු තුමන්ගේ ඥාතිවරයෙක්ද,මහිමෝත්තම අපෝස්තුලු වරයෙකු හා ප්‍රාණ පරිත්‍යාගියකුද වු ඔබවහන්සේ මා වෙත කරුණාව දක්වා මෙතැන් පටන් පාපිෂ්ඨ වු සකල අභ්‍යාසයන් අත්හැර දැමීමටද,සකල විධ නපුරු කල්පනා වලින් නිදහස්ව සිටීමටද,මාගේ සියලු උවමනා වලදී විශේෂ කොටම,පැමිණෙන උපදව විපත්ති වලදී ඔබගේ සහයෝගෝපාකාරය බලා කෙළවර ස්වර්ග රාජ්‍යයට පැමිණ ඔබ හා සමග පිතා පුත්‍රයා ශුද්ධාත්මයන් අති ශුද්ධවු ත්‍රිත්වයට වන්දනා කිරීමටද වරප්‍රසාද ලබාදුන මැනව.ආමෙන්.